ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

කෘෂි විද්‍යාව I
Agricultural Science I

08 S I

කාලය : පැය දෙකයි
Time : Two hours

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍රයේ අදාළ කවයේ (X) ලකුණ යොදන්න.

1) ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි රට වන්නේ,

1. පිලිපීනය 2. ශ්‍රී ලංකාව 3.ඉන්දියාව 4.ඇමෙරිකාව 5.චීනය

2) සුළඟේ වේගය පැයට 30km ක් නම් එම අවස්ථාව පිළිබඳ සත්‍ය වගන්තිය වන්නේ,

1. සෑම දිශාවකටම සුළං හමන තත්ත්වයකි.
2. අඩු පීඩන තත්ත්වයකි.
3. සුළි සුළං තත්ත්වයකි.
4. පීඩන අවපාතයකි.
5. සුළි කුණාටුවකි.

3) කෘෂිකාර්මික ඉඩම් වල ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. පසේ ව්‍යුහය දියුණු කිරීම.
2. පාංශු වාතනය දියුණු කිරීම.
3. වල්පැළෑටි මර්ධනය.
4. කාබනික ද්‍රව්‍ය පස සමඟ මිශ්‍ර කිරීම.
5. සියුම් වයනයක් සැකසීම.

4) වායුගෝලීය ඉහළ ආර්ද්‍රතාවය පවතින අවස්ථා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A. ශාක පත්‍රවල පූටිකා විවෘත වී ඇති බැවින් CO_2 අවශෝෂණය කාර්යක්ෂම වී ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි කරයි.
B. ආර්ද්‍රතාවය වැඩි අවස්ථාවලදි පූටිකා විවෘත වී ඇති බැවින් උත්ස්වේදන වේගය වැඩිවේ.
C. වායුගෝලීය ආර්ද්‍රතාවය වැඩි අවස්ථාවලදී ශාකවල දිලීර රෝග ව්‍යාප්තිය වැඩිවේ.
D. වායුගෝලීය ඉහළ ආර්ද්‍රතාවය ඇන්තූරියම් වැනි මල්වල ගුණාත්මක බව වැඩිකරයි.

ඉහත ප්‍රකාශ අතරින් ඉහළ වායුගෝලීය ආර්ද්‍රතාවය යටතේ වඩාත් නිවැරදි වන්නේ,

1. C හා D පමණි.
2. B, C හා D පමණි.
3. A, B හා C පමණි.
4. A, C හා D පමණි.
5. A, B, C හා D පමණි.

5) තැටි ක්‍රමය (disc Method) හා ප්ලැනි මීටරය මගින් ශාකවලින් ලබාගත හැකි මිනුමක් වන්නේ,

1. බෝග වර්ධන වේගය. 2. ශාකයේ පරිධිය. 3. පත්‍ර ක්ෂේත්‍රඵලය.

4. ශාකයේ වියළි බර 5. පත්‍ර සංඛ්‍යාව.

6) එළවළු හා පළතුරු සඳහා ප්‍රමාණවත් ජීව කාලයක් පවත්වා ගැනිම සඳහා වඩාත්ම වැදගත් වන සාධකය වන්නේ,

1. පාංශු භෞතික සාධක. 2. බෝග අස්වැන්නේ පරිනත බව.

3. බෝගය සිටුවා ඇති දේශගුණික කලාපය.

4. බෝගය වර්ධනය වන අවස්ථාවේ දී ලබාදුන් පෝෂක ප්‍රමාණය.

5. බෝග ප්‍රභේදය.

7) තිරසාර කෘෂිකාර්මික පද්ධතියක ශාක නිෂ්පාදන ප්‍රශස්ථ මට්ටමින් ලබාගැනිමට අනුගමනය කළ හැකි ස්වාභාවික සම්පත් ආශ්‍රිත උපාය මාර්ගයක් වන්නේ,

1. ඒක බෝග වගාව. 2. පළිබෝධ පාලනයට පියවර ගැනිම.

3. දෙමුහුම් ප්‍රභේද භාවිතය. 4. රසායනික පොහොර භාවිතය.

5. ජල හානි අවම කිරීමට බෝග වගාව පාලනය.

8) වියළි කලාපය තුළ බහුලව දක්නට ලැබෙන ප්‍රසාරණ හැකියාව වැඩි මැටි ඛණිජය වන්නේ,

1. කෙඔලිනයිට් 2.ෆ්ලෝරයිට් 3. මයිකා 4.මොන්ට්මොරිලොනයිට්

5. වර්මිකියුලයිට්

9) පාංශු ඛාදනය සම්බන්ධයෙන් දැක්වෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. Na^{+}හා K^{+} වැනි භාෂ්මික අයන පාංශු පැතිකඩෙන් ඉවත් වේ.

B. පසේ මතුපිට ස්ථරය ඉවත්වීම නිසා පාංශු ගැඹුර අඩු වේ.

C. පසේ ආම්ලිකතාවය වැඩි වේ.

D. පසේ ලවණතාවය වැඩිවේ.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. A හා B ප්‍රකාශ නිවැරදි වන අතර C හා D වැරදි ප්‍රකාශ වේ.

2. A, Bහා C ප්‍රකාශ නිවැරදි වන අතර D ප්‍රකාශය ඇතැම් විට සත්‍ය වේ.

3. A, B, හාC ප්‍රකාශ නිවැරදි වන අතර C ප්‍රකාශය මඟින් A තවදුරටත් පැහැදිලි කරයි.

4. A, Bහා C ප්‍රකාශ නිවැරදි වන අතර A මඟින් C ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි.

5. පාංශු ඛාදනය සම්බන්ධයෙන් ඉහත සියළුම ප්‍රකාශ සත්‍ය වේ.

10) භූමියක ප්‍රාථමික බිම් සැකසීම සිදුකර ඉතිරි බිම් සැකසීමේ කටයුතු අන්තර් පේළි ප්‍රදේශවලට පමණක් සීමා කරන්නේ,

1. උපරිම බිම් සැකසීමේදී ය.
2. අවම බිම් සැකසීමේදී ය.
3. ශූන්‍ය බිම් සැකසීමේදී ය.
4. පස මඩ කිරීමේදී ය.
5. පශ්චාත් බිම් සැකසීමේදී ය.

11) පරිණත පත්‍රවල අන්තර් නාරටි හරිතක්ෂය දැකිය හැක්කේ පහත දැක්වෙන කුමන පෝෂකය ඌන වීමෙන් ද?

1. N 2. P 3. K 4. Ca 5. Mg

12) ජල පොම්පයක් ක්‍රියාත්මක කළ පසු චූෂණ නලය දිගේ ජලය ඇදී නොඑන බව නිරීක්ෂණය විය. ඒ සඳහා හේතුවක් විය නොහැක්කේ,

1. ජල පොම්පයේ සිට පා කපාටය තෙක් නලයේ වාතය රැඳී තිබීම.
2. පා කපාටයෙන් ජලය කාන්දු වීම.
3. ජල මුද්‍රාව ගෙවී තිබීම.
4. ඉන්ධන නල මාර්ගයේ වාතය රැඳී තිබීම.
5. පා කපාටය ගැලවී තිබීම.

13) බීජ සුප්තතාවය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

සුප්තතාවයට හේතුව	සුප්තතාවය ඉවත් කරන ක්‍රමය	සුප්තතාවය දක්වන බීජ කාණ්ඩය
A. අල්ප විකසිත කලලය	ස්ථරීභවනය.	වී , බඩ ඉරිඟු
B. නිශේධක ද්‍රව්‍ය අඩංගුවීම.	දැව අලු මිශ්‍ර කර යෙදීම.	තක්කාලි , වැල් දොඩම්
C. දිලිසෙන බීජාවරණය	බීජාවරණය සීරිම.	සියඹලා , මදටිය
D. ඝනකම් බීජාවරණය	උෂ්ණත්ව ප්‍රතිකාර කිරීම.	අඹ , ලූණුමිදෙල්ල

මෙම ප්‍රකාශ අතරින් වඩාත්ම නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ ,

1. A හා B
3. C හා D
5. B පමණි.
2. B හා C
4. A හා D

14) බීජවල සෞඛ්‍යය හඳුනාගැනීමේදී Standred blotter test යොදා ගැනිමේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. දිලීර වර්ග ආසාදිත වීම පරික්ෂා කිරීම සඳහා.
2. බැක්ටීරියා වර්ග බීජවලට ආසාදනය වීම පරික්ෂා කිරීම සඳහා.
3. වෛරස් වර්ග බීජවලට ආසාදනය වීම පරික්ෂා කිරීම සඳහා.
4. සියලු ක්ෂුද්‍රජීවීන් බීජවලට ආසාදනය වීම පරික්ෂා කිරීම සඳහා.
5. බිජවල දිරිය පරික්ෂා කිරීම සඳහා.

15) පටක රෝපණ තාක්ෂණයේ දී පීඩන උදුන් හා පීඩන තාපක යොදාගෙන ජීවාණුහරණය සිදුකරන ක්‍රියාවලිය හඳුන්වන්නේ,

1. තෙත් තාප ජීවාණුහරණය.
2. විකිරණ තාප ජීවාණුහරණය.
3. වියළි තාප ජීවාණුහරණය.
4. පෙරීම මගින් සිදුකරන ජීවාණුහරණය (filtration)
5. ජෛව රසායනික ජීවාණුහරණය.

16) කිසියම් ලක්ෂණයක් ලබාදීමට ඇලීලික ජාන පිහිටා ඇති ආකාරය හඳුන්වන්නේ,

1. රූපානුදර්ශය ලෙසටයි.
2. ප්‍රවේණි දර්ශය ලෙසටයි.
3. ජන්මානු දර්ශය ලෙසටයි.
4. සහප්‍රමුඛතාවය ලෙසටයි.
5. ජාන සමයුග්මනය ලෙසයි.

17) නිර්පාංශු බෝග වගාවේ දී භාවිතා කරන පෝෂක මිශ්‍රණ වල අඩංගු වියයුතු ප්‍රධානතම ගුණාංගය විය යුත්තේ,

1. අත්‍යාවශ්‍ය මහා පෝෂක පමණක් එහි අඩංගු කිරීම.
2. සම්පූර්ණයෙන්ම එම පෝෂක මිශ්‍රණ ජලයේ ද්‍රාව්‍ය වීම.
3. P^H අගය 5ට වඩා අඩු අගයක පවත්වා ගැනීම.
4. කීලේට ආකාරයට පෝෂක වර්ග ආකලනය කිරීම.
5. පොහොර වර්ගවල භෞතික හා රසායනික ආකාරය සලකා බැලීම.

18) කෘමි පළිබෝධ හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත වගුවේ දැක්වේ.

පළිබෝධකයාගේ නම	ගෝත්‍රය	රූපාන්තරණය	හානිකරන ප්‍රධාන අවස්ථා
A) කහ පුරුක් පණුවා	Lepidoptera	පූර්ණ	සුහුඹුලා
B) අවුලකපෝරා	Coleoptera	පූර්ණ	කීටයා හා සුහුඹුලා
C) බෝංචි මැස්සා	Diptera	පූර්ණ	කීටයා
D) ගොයම් මකුණා	Hemiptera	පූර්ණ	සුහුඹුලා

ඉහත දැක්වෙන A,B,C,D ප්‍රකාශ අතරින් වඩාත්ම නිවැරදි වන්නේ,

1. A හා B
2. B හා C
3. C හා D
4. A හා D
5. A,B,C හා D

19) කෘමිනාශකයක් මිලදී ගැනීමේ දී සැලකිලිමත්විය යුතු වඩාත්ම වැදගත් සාධකය වන්නේ,

1. නියමිත ප්‍රමාණය පමණක් මිලදී ගැනීම.
2. කෘමියාට සුදුසු කෘමිනාශකය පමණක් මිලදී ගැනීම.
3. නිර්දේශිත ආයතනයකින් පමණක් මිලදී ගැනීම.
4. ලේබලයේ ඇති උපදෙස් පිළිපැදීම.
5. කෘමිනාශකයේ මිල ගැන සැලකිලිමත් වීම.

20) පහත සටහනේ වල්පැළෑටි කාණ්ඩ කිහිපයකට බෙදා දැක්වේ.

තෘණ වර්ග	පත් වර්ග	පළල් පත්‍ර වල්පැළෑටි	ආක්‍රමණශීලී වල්පැළෑටි	ජලජ වල් පැළෑටි
A	B	C	D	E

අනුපිළිවෙළින් A,B,C,D,E යන වල්පැළෑටි කාණ්ඩ සඳහා උදාහරණ දැක්වෙන ප්‍රකාශය වන්නේ,

1. වෙල්මාරුක්, තුනැස්ස, ගඳපාන, ඇටවරා, පාතිනියම්
2. බජිරි, කලාදුරු, කඩුපහර, සැල්වීනියා, ඇටවරා
3. බැබිල, වෙල්මාරුක්, තුන්හිරිය, දියහබරල, ගඳපාන
4. බැලතණ, කුඩමැට්ට, මොනරකුඩුම්බිය, ජපන්ජබර, දියහබරල
5. කඩුපහර, වෙල්හිරිය, වෙල්මාරුක්, සැල්වීනියා, ජපන්ජබර

21) Azospirillum පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. ස්වායු බැක්ටීරියාවකි.
2. සහජීවී බැක්ටීරියාවකි.
2. Poaceae කුලයේ ශාක සමඟ සහජීවීව ජීවත් වන බැක්ටීරියාවකි.
3. ජලය මත පාවෙන පර්ණාංග මත ජීවත් වන බැක්ටීරියාවකි.
4. නයිට්‍රජන් තිරකිරීමට දායක වන බැක්ටීරියාවකි.

22) වර්ධනය විය හැකි සක්‍රිය අංකුර කිහිපයක් සහිත ශාක අත්තක් එම කුලයටම අයත් ග්‍රාහක ශාකයක් සමඟ සම්බන්ධකර තනි ශාකයක් ලෙස වර්ධනය වීමට ඉඩ සලසා ගන්නේ,

1. පැලැස්තර බද්ධයට.
2. T බද්ධයට.
3. H බද්ධයට.
4. ගොඩැලි බද්ධයට.
5. ආරුක්කු බද්ධයට.

23) යම් ජීවියෙකු අයත් ගහණය තුළ ඇති ජිනෝම වල එකතුව හඳුන්වන්නේ,

1. ජාන විසංගමනය ලෙසයි.
2. ජාන ආකලනය ලෙසයි.
3. ජාන කිටුව ලෙසයි
4. ජාන සංචරණය වීම ලෙසයි.
5. ජාන බැංකුව ලෙසයි.

24) වියළි කලාපයේ වාරිජලය සම්පාදනය කරන බිම්වල එම ජලයෙන් 10-20% පමණ භූමියෙන් ඉවත්ව යාමට සැලැස්විය යුතු වන්නේ,

1. ශාක මුල් හොඳින් වර්ධනය වීමට.
2. නිර්වායු තත්ත්ව ඇතිවීම වැළැක්වීමට.
3. බිම් සැකසීමේ කටයුතු පහසුවීමට.
4. ක්ෂේත්‍රධාරිතාවයේ පස පවත්වාගැනීමට.
5. වාරි ජලය සමඟ පැමිණෙන විවිධ ලවණ පසේ එක්රැස්වීම වැළැක්වීමට.

25) ක්වෝෂියෝකෝර් (Kwashiorkor)යන රෝගී තත්ත්වය ඇති වන්නේ,

1. මේදය සහිත ආහාර වැඩිපුර ගැනීමෙනි.
2. විටමින් A අඩංගු ආහාර වැඩිපුර ගැනීමෙනි.
3. ප්‍රෝටීන් කැලරි මන්දපෝෂණය ඇතිවන නිසාය.
4. කාබෝහයිඩේට් වැඩිපුර අඩංගු ආහාර පරිභෝජනයෙනි.
5. ක්ෂණික ආහාර වර්ග වැඩිපුර පරිභෝජනයෙනි.

26) ජෛව රසායනික ආහාර පරිරක්ෂණ ක්‍රමයක් ලෙස සලකන්නේ,

1. වියළීම
2. සුව්‍රිකරණය
3. පැසවීම
4. අධිශීතනය
5. වියළීම

27) ආහාරපාන වර්ග සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවදානම් අවස්ථා පාලනය කිරීම සඳහා වැදගත් වන තත්ත්ව ආරක්ෂණයක් වන්නේ,

1. HACCP සහතිකකරණය. 2.GMP සහතිකකරණය. 3.GHP සහතිකකරණය.
4. GAP සහතිකකරණය. 5.ආහාර ආකලන වර්ග සහතිකකරණය.

28) කාබනික ගොවිතැන පිළිබඳව පහත දී ඇති ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,

1. ජානමය වශයෙන් නවීකරණය කළ බෝග ප්‍රභේද භාවිතා වේ.
2. ක්ෂුද්‍රජීවී ක්‍රියාවලි මඟින් පෝෂක සුලභතාවය ඇතිකරයි.
3. යාන්ත්‍රිකරණය ශුන්‍ය වේ.
4. ඇතැම්විට පළිබෝධනාශක භාවිතා කරයි.
5. පාංශු සෞඛ්‍යය රැකගැනීම කෙරෙහි විශේෂ අවධානයක් නැත.

29) එක්තරා පසක පාංශු ජල ප්‍රතිශතය (වියළි බරට සාපේක්ෂව) 15%කි.එම පසේ දෘෂ්‍ය ඝනත්වය 1.5gcm^{-3}වේ නම් පසේ ජල ප්‍රමාණය පරිමාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වෙන්නේ,

1. 2.25% 2. 22.5% 3. 15% 4. 1.5% 5. 0.15%

30) රෝමාන්තික සතුන් හට සත්ත්ව ප්‍රෝටීන් ප්‍රභව පිටතින් ලබාදීම අත්‍යාවශ්‍ය නොවීම පිළිබඳව පහත දී ඇති ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,

1. ශාක ප්‍රෝටීන් වලින් ක්ෂුද්‍රජීවී ප්‍රෝටීන් නිෂ්පාදනය වී ඒවා ජීර්ණය වන නිසාය.
2. සත්ත්ව ප්‍රෝටීන් ප්‍රභව අවශ්‍ය විටකදි අවශ්‍ය ප්‍රමාණවලින් ලබාගත නොහැකි නිසාය.
3. සත්ත්ව ප්‍රෝටීන් ප්‍රභව රෝමාන්තිකයින්ට ජීර්ණය කළ නොහැකි නිසාය.
4. සත්ත්ව ප්‍රෝටීන් ප්‍රභව වලට රෝමාන්තිකයින් රුචිකත්වයක් නොදක්වන නිසාය.
5. සත්ත්ව ප්‍රෝටීන් ප්‍රභව වල මිල අධික නිසාය.

31) වසු පැටවුන්ට දළ ආහාර හඳුන්වා දීම සුදුසු කාලසීමාව වන්නේ,

1. ඉපදී දින 3 – 4 පසු
2. ඉපදී දින 5 – 6 පසු
3. ඉපදී දින 8 – 10 පසු
4. ඉපදී මාස 1 ට පසු
5. ඉපදී මාස 2 ට පසු

32) කිකිළි බිත්තරයක ඇති ඩිම්බ රජ්ජුවේ කාර්යය වන්නේ,

1. වායු හුවමාරුව සිදු කිරීම.
2. වැඩෙන කලලයට කැල්සියම් ලබාදීම.
3. ක්ෂුද්‍රජීවීන් ඇතුළුවීම වැළැක්වීමට.
4. බිත්තරය වියළී යාමෙන් ආරක්ෂා කිරීමට.
5. බාහිර කම්පන වලින් කලලය ආරක්ෂා කිරීම.

33) රෝමාන්තික ආහාර ජීර්ණ පද්ධතියේ, සංකීර්ණ ආමාශය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දී ඇත.

A.) රූමන බිත්තියේ අභ්‍යන්තරව ජීර්ණ එන්සයිම නිපදවන ග්‍රන්ථි සුළු වශයෙන් පවතී.

B.) විතංශිකාවේ අභ්‍යන්තර බිත්තියේ පිටිකා නොමැති අතර මී වදයක හැඩය ගනී.

C.) බහුනැම්යේ දී ආහාරයේ අඩංගු ජලය හා ඛණිජ ප්‍රතිශෝෂණය කරයි.

D.) ජඨාරාශය තුළ රසායනික මෙන්ම ක්ෂුද්‍රජීවී ජීර්ණය ද සිදුවේ.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,

1. A හා B පමණි.
2. B හා C පමණි.
3. C හා D පමණි.
4. A,B හා C පමණි.
5. B,C හා D පමණි.

34) ගොවියෙකු විසින් සයිලේජ් නිපදවීමේ දී එම තෘණ සමඟ සහල් නිවුඩු මිශ්‍ර කොට සයිලෝව පුරවන ලදි. එසේ තෘණ වලට සහල් නිවුඩු මිශ්‍ර කරන ලද්දේ,

1. ක්ෂුද්‍රජීවීන්ට අවශ්‍ය ශක්ති ප්‍රභවයක් සැපයීමටයි.
2. සයිලේජ් වල ගුණාත්මකභාවය ඉහළ දැමීමටයි.
3. ගවයාගේ ආහාර රුචිකත්වය වැඩිකිරීමටයි.
4. නිපදවන ලද සයිලේජ් දිගුකල් තබාගැනීමටයි.
5. අදාළ ප්‍රදේශයේ තෘණ ප්‍රමාණවත් තරම් නොතිබීම නිසයි.

35) බිත්තර හරහා කුකුළු පැටවුන්ට සම්ප්‍රේෂණය වියහැකි රෝගයක් වන්නේ,

1. රැනිකට්
2. පුල්ලෝරම්
3. කොක්සිඩියෝසිස්
4. කුකුළු වසූරිය
5. ගම්බෝරෝ

36) පරාග කාරක කෘමීන් වඩාත් හොඳින් සුරක්ෂිතවන්නේ,

1. ජෛවගතික ගොවිතැන්දීය.
2. යථා තත්‍ය ගොවිතැන්දීය.
3. වියළි ගොවිතැන්දීය.
4. සමෝධාන ගොවිතැන්දීය.
5. වර්ෂාපෝෂිත ගොවිතැන්දීය.

37) කෘෂි යන්ත්‍රවල අධික ශබ්ද ඇතිවීමට හේතුවන තත්ව කිහිපයක් පහත ප්‍රකාශවල දැක්වේ.

A) ස්නේහක නොයෙදීම.

B) යන්ත්‍රවල විශාලත්වය වැඩිවීම.

C) ගෙවීගිය කොටස් සහිත යන්ත්‍රවීම.

D) ක්‍රියාකරුවාගේ කාර්යක්ෂමතාවය අඩුවීම.

ඉහත ප්‍රකාශ අතරින් කෘෂි යන්ත්‍රවල අධික ශබ්දයක් ඇතිවීමට බලපාන්නේ,

1. B හා D පමණි.
2. A හා C පමණි.
3. A,C හා D පමණි.
4. A,B හා C පමණි.
5. A,B,C හා D පමණි.

38) යම් භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය සමඟ ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පෙන්වන සාධකය වන්නේ,

1. අදාළ භාණ්ඩයේ මිල.
2. නිෂ්පාදන සාධකවල මිල.
3. සැපයුම්කරුවන් සංඛ්‍යාව.
4. සහනාධාර ලබාදීම.
5. බදු ඉවත් කිරීම.

39) යම් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් වක්‍රයට වඩා අඩු ප්‍රමාණයකින් සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ නම්,

1. භාණ්ඩයේ සමතුලිත මිල පමණක් වැඩිවන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
2. භාණ්ඩයේ සමතුලිත මිල අඩුවන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
3. භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය යන දෙකම වැඩිවේ.
4. භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය යන දෙකම අඩුවේ.
5. භාණ්ඩයේ සමතුලිත මිල හෝ සමතුලිත ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ.

40) නිෂ්පාදන හැකියා වක්‍රයක් පිළිබඳව පහත දී ඇති ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,

1. එම වක්‍ර සැමවිටම මුල ලක්ෂ්‍යයට උත්තල වේ.
2. එම වක්‍ර සැමවිටම සරල රේඛීය වේ.
3. එම වක්‍ර වලින් සැමවිටම අඩුවන ආවස්ථික පිරිවැයක් පෙන්වයි.
4. එම වක්‍ර වලින් සැමවිටම වැඩිවන ආවස්ථික පිරිවැයක් පෙන්වයි.
5. එම වක්‍රවල බෑවුමෙන් ආවස්ථික වියදම පෙන්වයි.

41) යම් නිෂ්පාදනයකට අගය එකතු කිරීමෙන් නිෂ්පාදන ආයතනයක් බලාපොරොත්තුවන අරමුණු කිහිපයක් පහත දැක්වේ.

A.) වෙළඳපලේ ඇති අනෙකුත් සමජාතීය නිෂ්පාදන සමඟ තරඟ කිරීමට ඇති හැකියාව වැඩිවීම.

B.) වෙළඳපල දාමයේ සියළු දෙනාටම ඉහළ ආදායමක් ලැබීම.

C.) පාරිභෝගිකයාට ගුණාත්මක ආහාර ලැබීම.

ඉහත අරමුණු අතරින් ඍජුවම රටක ආහාර සුරක්ෂිතතාවයට දායක වන්නේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. B හා C පමණි.
5. A, B හා C පමණි.

42) එක්තරා ගොවිපළක නිමැවුම් ඒකක දෙකක් නිෂ්පාදනය කිරීමේ දී වියදම් ලේඛනයක් පහත දැක්වේ.

මුළු ස්ථාවර වියදම = රු.50/-

මුළු වියදම = රු.130/-

ඉහත අවස්ථාවේ දී සාමාන්‍ය විචල්‍ය වියදම වන්නේ,

1. රු.80
2. රු.180
3. රු.40
4. රු.90
5. රු.65

43) පාංශු කලීල අංශුන් පිළිබඳව පහත දී ඇත්තේ ප්‍රකාශ කිහිපයකි.

A.) ජලය තුළ අවලම්භනය වේ.

B.) විශ්කම්භය 0.002mm ට වඩා අඩු අංශුන් අයත් වේ.

C.) මතුපිට ඍණ ලෙස ආරෝපිතව පවතී.

D.) පාංශු කැටයන හුවමාරුව සඳහා දායක නොවේ.

E.) මේවායේ පෘෂ්ඨික ක්ෂේත්‍රඵලය ඉතා අඩුය.

ඉහත ප්‍රකාශ අතරින් මැටි කලීල සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1. C, D, E පමණි.
2. A, D, C පමණි.
3. A, B, C, D, E පමණි.
4. A, B, C හා E පමණි.
5. A, B හා C පමණි.

44) ඉසින ද්‍රව බිංදුවල විශ්කම්භය අඩුවීම හා විසර්ජන සීඝ්‍රතාවය අවම වීම සිදුවන්නේ,

1. කුඩු ඉසින යන්ත්‍ර වලදිය.
2. අධිපරිමා යන්ත්‍ර වලදිය
3. අව පරිමා යන්ත්‍ර වලදිය.
4. දුම් ඉසින යන්ත්‍ර වලදිය.
5. කැට ඉසින යන්ත්‍ර වලදිය.

45) ශාක නිරෝධායනය හා සංරක්ෂණය සඳහා ඇති පනතට අනුව නීති අණපනත් අනුගමනය කරමින් පළිබෝධ කළමණාකරණය කිරීම හඳුන්වන්නේ,

1. ජෛව රසායනික පළිබෝධ කළමණාකරණය ලෙසයි.
2. ව්‍යවස්ථාපිත පළිබෝධ කළමණාකරණය ලෙසයි.
3. රසායනික පළිබෝධ කළමණාකරණය ලෙසයි.
4. සමෝධානික පළිබෝධ කළමණාකරණය ලෙසයි.
5. ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමණාකරණය ලෙසයි.

46) ශාකවල සිදුවන විවිධ පරිවෘත්තීය ක්‍රියා නිසා ඇතිවන වැදගත්කම් කිහිපයක් පහත ප්‍රකාශ වල දැක්වේ.

A.) ශෛලමීය පරිවහනයට අවශ්‍ය බලය ලබාදීම.

B.) විවිධ ශාක , විවිධ වර්ගවල සංචිත ආහාර නිපදවීම.

C.) විවිධ කාබනික සංයෝග බිඳහෙලීම.

D.) ශාකය සිසිල් වීම.

ඉහත ප්‍රකාශ අතරින් උත්ස්වේදනයේ ඇති වැදගත්කම් වන්නේ,

1. A පමණි.
2. A හා B පමණි.
3. B හා C පමණි.
4. C හා D පමණි.
5. A හා D පමණි.

47) තක්කාලි හා වී වැනි බෝගවල ජල ඌණතාවයට වඩාත් සංවේදී වර්ධන අවධි / අවධිය වන්නේ,

1. බීජ පැළ අවධිය.
2. වර්ධක අවධිය.
3. ප්‍රජනන අවධිය.
4. පරිනත අවධිය.
5. වර්ධක හා ප්‍රජනන යන අවධි දෙකම.

48) පොහොර මිශ්‍රණයක පොහොර ශ්‍රේණිය 23 – 10 – 15 ලෙස සඳහන් වී ඇති අවස්ථාවක පොහොර මිශ්‍රණය 1000Kg ක් නිපදවීමට යෙදිය යුතු යූරියා ප්‍රමාණය සමාන වන්නේ,

1. 46Kg 2. 92Kg 3. 184 Kg 4. 230 Kg 5. 500 Kg

49) ගොවි මහතෙකු විසින් මෙයට පෙර වගා නොකළ භූමියක යම් බෝගයක් ස්ථාපනය කිරීමට අදහස් කරන ලදි.මෙහි දී ඔහු සිටවීම සඳහා බෝගයක් තෝරා ගැනීමේ දී වඩාත් වැදගත් වන සාධකය වන්නේ,

1. පාංශු උෂ්ණත්වය.
2. පාංශු ජල ප්‍රතිශතය.
3. පාංශු ව්‍යුහය. .
4. දාෂ්‍ය සනත්වය.
5. පාංශු වයනය

50) බෝග කිහිපයක කළමණාකරණ අනුමත හායන මට්ටම් (MADL) (Management allowed depletion level) පහත වගුවේ දැක්වේ.

බෝගය	MADL අගය
බඩ ඉරිඟු	50
මිරිස්	55
අර්තාපල්	40
බෝංචි	35
මිදි	65

ඉහත දත්තයන්ට අනුව වැඩිම ජල සම්පාදන කාලාන්තරයක් පවත්වා ගතයුතු බෝගය වන්නේ,

1. මිදි 2. බෝංචි 3. අර්තාපල් 4. මිරිස් 5. බඩඉරිඟු